# ව්‍යාපාර නාම ලියාපදිංචිය සඳහා අයදුම්කරුවන්ට උපදෙස්

## ඉදිරිපත් කළ යුතු ලියවිලි

01. නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය ඉදිරිපත් කරන්න. (ටිපෙක්ස් නොකළ යුතුය. පුද්ගලික සමාගම, සීමාසහිත සමාගම, සමූහ ව්‍යාපාර, පදනම, කාර්යාංශය, සංගමය, සංසදය, සමාජය, ව්‍යාපාර හිමියන්ගේ එකතුව, සුභසරණ සේවය, ජාත්‍යන්තර පාසැල, සමිතිය, සමුපකාරය, සංස්ථාව, පාසැල, මණ්ඩලය, කේන්ද්‍රය, කණ්ඩායම, ජාත්‍යන්තර සහයෝගිතාවය හෝ එවැනි ජනතාව නොමඟ යවන සුළු පද එකතු කර ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීම කළ නොහැක. ජනාධිපතිවරයා, ජනාධිපති, ජාතික, රාජ්‍ය හෝ ශ්‍රී ලංකා හෝ වෙනත් රටක නාමයක් ව්‍යාපාර නාමයක් ලෙස භාවිතා කළ නොහැක. රෙජිස්ට්‍රාර්වරයාගේ මතය අනුව ජනාධිපතිවරයාගේ අනුග්‍රාහකත්වය නැතහොත් ආණ්ඩුවේ හෝ ආණ්ඩුවේ යම් දෙපාර්තමේන්තුවක් සමඟ යම් සම්බන්ධතාවයක් හඟවන හෝ හැඟවීමට ඉඩ ඇති වචන, නාගරික හෝ සංස්ථාගත හෝ සමාගම යන වචන ව්‍යාපාර නාමයක් ලෙස භාවිතා කළ නොහැක)
ව්‍යාපාරයේ ස්වාභාවය ලෙස කරනු ලබන ව්‍යාපාරයේ සියළු කටයුතු පැහැදිලිව නිසියාකාරව සම්පූර්ණ කළ යුතුය.

02. ව්‍යාපාර ස්ථානයට අදාල ලියාපදිංචි ඔප්පුවේ පිටපත/බදු ඔප්පුවෙහි පිටපත ( ග්‍රාම නිලධාරි මඟින් සහතික කළ) සමඟ මුල් පිටපත ඉදිරිපත් කළ යුතුය. එය සසඳා බලා ආපසු භාරදෙනු ලැබේ.ඔප්පුව බැංකුවක ඇපයට තබා ඇත්නම් බැංකුව මඟින් සහතික කරන ලද පිටපතක් ඉදිරිපත් කළ යුතුය.

ව්‍යාපාරික ස්ථානය තමා සතු නොවේ නම් එම ඔප්පුවෙහි පිටපත, ඉඩම් හිමිගේ කැමැත්ත ප්‍රකාශිත ලිපියක් හා ජාතික හැඳුනුම්පත් පිටපත සමඟ ඉදිරිපත් කළ යුතුය. එම ලිපිය ග්‍රාම නිලධාරි ඉදිරිපිට අත්සන් කළ යුතු වන අතර ග්‍රාම නිලධාරි විසින් තමා ඉදිරිපිට අත්සන් කළ බව සහතික කළ යුතුය.

ඉඩම් හිමිගේ ජාතික හැඳුනුම්පත් පිටපත ග්‍රාම නිලධාරි විසින් සහතික කළ යුතුය.

ජීවිත භුක්තිකරුවන් සිටී නම් ඔවුන්ගේ කැමැත්ත ප්‍රකාශිත ලිපි හා ග්‍රාම නිලධාරි සහතික කළ ජාතික හැඳුනුම්පත් පිටපත් ඉදිරිපත් කළ යුතුය. එම ලිපිය ග්‍රාම නිලධාරි ඉදිරිපිට අත්සන් කළ යුතු වන අතර ග්‍රාම නිලධාරි විසින් තමා ඉදිරිපිට අත්සන් කළ බව සහතික කළ යුතුය.

03. ව්‍යාපාරය හිමිකරුගේ/හිමිකරුවන්ගේ ජාතික හැඳුනුම්පත් පිටපත (ග්‍රාම නිලධාරි විසින් සහතික කළ) ජාතික හැඳුනුම්පත සමඟ ඉදිරිපත්කළ යුතුය.

04. ව්‍යාපාරය පවත්වාගෙන යන බවට ග්‍රාම නිලධාරි වාර්තාව ඔබගේ ව්‍යාපාරය පිහිටි වසමේ ග්‍රාම නිලධාරි මඟින් ලබාගත යුතුය. (මේ සමඟ ඉදිරිපත් කර ඇති ආකෘතිය මගින්) තවද, ව්‍යාපාරිකයාගේ පදිංචියව්‍යාපාරය පිහිටි වසමෙන් පිටත වන්නේ නම් එම වසමේ ග්‍රාම නිලධාරි මගින් පදිංචි සහතිකයක්ද ඉදිරිපත් කළ යුතුය.

05. ව්‍යාපාරය පිහිටි ප්‍රාදේශීය සභාවට මෙම වර්ෂයට බදු ගෙවා ලබා ගත් කුවිතාන්සිය (මෙහි ව්‍යාපාරයේ ස්වාභාවය පැහැදිලිව සඳහන් කළ යුතුය.) ඉදිරිපත් කළ යුතුය.

06. හවුල් ව්‍යාපාර ගිවිසුමක් ඇතොත් එහි පිටපතක්.

07. ආරම්භ ප්‍රාග්ධන මුදල සනාථ කිරීම සඳහා ව්‍යාපාරිකයා විසින් විධිමත් දිවුරුම් ප්‍රකාශයක් ලබා දිය යුතුය.

* ව්‍යාපාරය ආරම්භ කර මසකට පසු ලියාපදිංචි කරන්නේ නම් දිනකට රු. 10/- ක ගාස්තුවක් අය කෙරේ.

**අවස්ථානුකූලව කැඳවනු ලබන ලියවිලි -**

1. කෘෂිකාර්මික ව්‍යාපාර ලියාපදිංචි කිරීමේදී බීජ හා රෝපණ ද්‍රව්‍ය පරිහරණය කරන්නන් (නිෂ්පාදකයන්, අලෙවිකරන්නන්හා ආනයනකරුවන් වැනි) **සඳහා 2003 අංක 22 දරණ බීජ පනත තුළ** ලියාපදිංචි වී සිටිය යුතුය. (ඒ සඳහා අදාල ගොවිජන සේවා මධ්‍යස්ථාන මගින් උපදෙස් ලබා ගත හැක.)

2. රූපලාවන්‍ය ආයතන, සම්භාහන ආයතන, පච්ච කොටන ස්ථාන, කොණ්ඩා සැකසුම් මධ්‍යස්ථාන හා විලවුන් විකුණන ස්ථාන සඳහා **ගම්පහ පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකගේ** නිර්දේශය සහ ඖෂධ අලෙවිසැල්, වෛද්‍ය මධ්‍යස්ථාන සඳහා **ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ** නිර්දේශය.

3. පලිබෝධනාශක සම්බන්ධ ව්‍යාපාර ලියාපදිංචි කිරීමේදී **කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ** අනුමැතිය.

4. මැණික් සහ ස්වර්ණාභරණ සම්බන්ධ ව්‍යාපාර සඳහා **ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ** අනුමැතිය.

5. මුද්‍රණාලයක් සම්බන්ධයෙන් **ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ** අනුමැතිය සමග අධිකරණයෙන් ලබාගත් ප්‍රකාශය.

6. ආයුර්වේද ප්‍රතිකාර, ආයුර්වේද බෙහෙත් ශාලා ලියාපදිංචියේදී **ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී** නිර්දේශ, ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි වෛද්‍යවරයකු ලෙස සනාථ කිරීම සහ ආයුර්වේද කොමසාරිස් වෙතින් ලබාගත් බලපත්‍රය.

7. නවාතැන් පහසුකම් සැපයීම සිදුකරන්නේ නම් අදාල ස්ථානය පිළිබඳ පොලිස් නිරීක්ෂණ වාර්තාවක්.

8. ප්‍රවාහන පහසුකම් සපයන්නේ නම් අදාල වාහනයේ/වාහනවල ලියාපදිංචි සහතිකයේ, ආදායම් බලපත්‍රයේ, රක්ෂණ සහතිකයේ සහ රියැදුරු බලපත්‍රයේ පිටපත් ග්‍රාම නිලධාරී සහතික කර ඉදිරිපත් කල යුතුය.

9. අවස්ථානුකූලව මෝටර් ගරාජ්, වාහන පින්තාරු කරන ආයතන, බ්ලොක් ගල් ව්‍යාපාර, මැටි සම්බන්ධ ව්‍යාපාර ආදී ප්‍රදේශවාසී විරෝධතා පැන නැගිය හැකි ව්‍යාපාර සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍රය/ප්‍රදේශවාසී විරෝධතා නොමැති බවට ග්‍රාම නිලධාරී වාර්තාව.

10. ආහාර ද්‍රව්‍ය සම්බන්ධ ව්‍යාපාර සඳහා **මහජන සෞඛ්‍ය පරීක්ෂක** වාර්තාව.

11. පාඨමාලා, උපකාරක පන්ති, තාක්ෂණික දැනුම ආදිය ලබාදෙන ස්ථාන ලියාපදිංචි කිරීමේදී වෘත්තීය සුදුසුකම් සනාථ කරන සහතික ඉදිරිපත් කළ යුතුය.

12. පෙර පාසැල් ලියාපදිංචියේදී පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පෙර පාසැල් අධ්‍යක්ෂකගේ නිර්දේශය ලබා ගත යුතුය.

13. පොල් ආශ්‍රිත කර්මාන්ත කරුවන් ව්‍යාපාර ලියාපදිංචියේදී පොල් සංවර්ධන අධිකාරියේ අනුමැතිය ලබා ගත යුතුය.(උපදෙස් සඳහා 011 2502502-4 පොල් සංවර්ධන අධිකාරිය)

**<u>ලියාපදිංචි ගාස්තු</u>**

| | |
|---|---|
| ප්‍රාග්ධන ආයෝජනය රු.300,000.00 දක්වා කුඩා ව්‍යාපාර සඳහා | රු. 500.00 |
| ප්‍රාග්ධන ආයෝජනය රු.300,001.00 සිට රු.500,000.00දක්වා | රු. 1000.00 |
| ප්‍රාග්ධන ආයෝජනය රු.500,001.00 ට වැඩි ව්‍යාපාර සඳහා | රු.2,500.00 |

හවුල් ව්‍යාපාර සඳහාද මෙම ගාස්තු ක්‍රමය අදාල වේ.